“කවරෙකු සුදුළූණු හෝ ළූණු අනුභව කළේ ද ඔහු අපෙන් ඉවත්ව සිටිත්ව සිටිය යුතුය. - එසේ නැතහොත් අපගේ මස්ජිදයෙන් ඉවත්ව සිටිය යුතුය.- ඔහුගේ නිවසේ ඔහු රැඳී සිටිය යුතුය

සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “කවරෙකු
සුදුළූණු හෝ ළූණු අනුභව කළේ ද ඔහු අපෙන් ඉවත්ව සිටිත්ව සිටිය යුතුය. - එසේ නැතහොත් අපගේ මස්ජිදයෙන් ඉවත්ව සිටිය යුතුය.- ඔහුගේ නිවසේ ඔහු රැඳී සිටිය යුතුය. සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත කොළ වර්ග සහිත එළවලු භාජනයක් ගෙන එන ලදී. එවිට එතුමාණන්ට එහි දුර්ගන්ධයක් දැනී, ඒ ගැන එතුමාණෝ විමසා සිටියහ. එහි ඇත්තේ පළාවර්ග යැයි දන්වන ලදී. පසුව එතුමාණන් සමග සිටි එතුමාණන්ගේ ඇතැම් සහගාමීන් වෙත ඒවා පිළිගන්වන්නැයි පවසා සිටියහ. එතුමාණන්ට එය දැනුනු කල්හි එතුමාණෝ එය අනුභව කිරීමට පිළිකුල් කර, මෙසේ පැවසූහ. "ඔබ අනුභව කරන්න. සැබැවින්ම ඔබ රහසින් කතා නො කරන්නා සමග මම රහසින් කතා කරන්නෙක්මි" යැයි පැවසූහ. ඉමාම් මුස්ලිම් සතු වාර්තාවක නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්රකාශ කළ බව ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කල හදීසයක් මෙසේ සඳහන් වේ. “කවරෙකු මෙම පළාවර්ග අතරින් අනුභව කළේ ද -තවත් විටෙක- කවරෙකු සුදුළූණු ළූණු ලීක්ස් අනුභව කළේ ද එවැන්නන් අපගේ මස්ජිදයට සමීප නොවිය යුතුයි. සැබැවින්ම ආදම්ගේ
දරුවන් වේදනා විඳින දැයින් මලක්වරුන් ද වේදනා විඳිනු ඇත.” [صحيح] [متفق عليه]

සුදු ළූණු හෝ ළූණු හෝ අනුභව කර, මස්ජිදයට පැමිණීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වැළැක්වූහ. ඒවායින් හමන දුර්ගන්ධය හේතුවෙන් සමූහ සලාතය සඳහා සහභාගී වන තම සහෝදරයින් පීඩා නොවනු පිණිසය. එම තහනම මස්ජිදයට පැමිණිම ගැන අවවාදය මිස ඒවා අනුභව කිරීම සම්බන්ධයෙන් නොවේ. ඒවා අනුමත ආහාර වර්ග වේ. ලීක්ස් වැනි කොළ සහිත භාජනයක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත ගෙන එන ලදී. එහි ගන්ධය එතුමාණන්ට දැනුනු කල්හි, එය එතුමාණන් අනුභව නොකර සිටීමට හේතු දන්වා ඒවා අනුභව කිරීම සඳහා එතුමාණන්ගේ සහගාමියෙකුට පිළිගන්වූහ. ඔහු ද එය පිළිපදිමින් පිළිකුල් කළේය. සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ එය දුටු කල්හි, ඔහුට මෙසේ පැවසූහ: ඔබ අනුභව කරන්න. හේතුව සැබැවින්ම මම දිව්ය පණිවිඩ සම්බන්ධයෙන් මලක්වරුන් සමග කතා කරමි" යැයි පවසා සිටියහ. දුර්ගන්ධය හේතුවෙන් මිනිසුන් වේදනාවට පත්වන්නාක් මෙන්ම සැබැවින්ම මලක්වරු ද වේදනාවට පත් වන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ.

http://sunnah.global/hadeeth/si/show/4850